" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000
ISO 9001
ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-AP/03/FI/02(A) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.02.01 |
|---|---|---|---|---|---|

**බස්නාහිර පළාත්**

**ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2022**

**බස්නාහිර පළාතේ,**
**සියළුම ලේකම්වරුන්,**
**පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන වල**
**සභාපතිවරුන් වෙත.**

**රාජ්‍ය ව්‍යාපාරයන්හි සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස**

භාණ්ඩාගාර ලේකම්ගේ 2021.12.14 දිනැති "රාජ්‍ය ව්‍යාපාරයන්හි සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස" සම්බන්ධයෙන් නිකුත් කරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2021 හි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2022.01.24 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම් පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්:
i. ආණ්ඩුකාර ලේකම් (ඛ.ප.)
ii. විගණකාධිපති.
iii. සියළු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (ඛ.ප.)
iv. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) (ඛ.ප.)
v. තොරතුරු තාක්ෂණ නිලධාරී

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை | The Secretariat, Colombo 01, Sri Lanka

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | (94)-11-2484500<br>(94)-11-2484600<br>(94)-11-2484700 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | (94)-11-2449823 | වෙබ් අඩවිය<br>வெப் சைட்<br>Website | www.treasury.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | PE/COP/POLI/Circulars | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021.12.14 |

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2021

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් හා

රාජ්‍ය ව්‍යාපාර (රාජ්‍ය බැංකු ද ඇතුළුව) සභාපතිවරුන් වෙත

<u>රාජ්‍ය ව්‍යාපාරයන්හි සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස</u>

2021.12.10 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ 2022 මුදල් වර්ෂයට අදාළ විසර්ජන පනතේ විධිවිධාන හා අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශ මත, දැනට රාජ්‍ය ව්‍යාපාරයන්හි සේවයේ නියුතු සේවකයින්ගේ පවත්නා විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව සංශෝධනය කිරීමට තීරණය කර ඇති අතර, ඒ අනුව පහත සඳහන් විධිවිධාන 2022.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

I. මෙම චක්‍රලේඛයේ III වන ඡේදයට යටත්ව, රාජ්‍ය ව්‍යාපාරයන්හි සේවකයින්ගේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 57ක් වන අතර කිසියම් නිලධාරියෙකු වයස අවුරුදු 57 ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම්, සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 62 දක්වා සේවයේ රැඳී සිටිය හැකිය.

II. අවුරුදු 57 සිට 62 අතර කාල පරිච්ඡේදය තුළ නිලධාරියාගේ අභිමතය පරිදි පත්වීම් බලධරයා වෙත මාස 3 ක පූර්ව දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව විශ්‍රාම ගත හැකිය.

III. කාර්යක්ෂමතාවය හා කාර්යසාධනය සතුටුදායක නොවන නිලධාරියකුට වයස අවුරුදු 57 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීමක් ලබා නොදීමට පත්වීම් බලධරයා තීරණය කරන්නේ නම්, එයට එරෙහිව නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සැලසෙන ආකාරයෙන් මාස 6 ක පූර්ව දැනුම්දීමකින් පසුව විශ්‍රාම ගැන්වීමේ බලය පත්වීම් බලධරයා සතුවේ.

IV. එසේම, මෙහි දක්වා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී, රජය සතු ව්‍යවසායයන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි (Operation Manual for State-owned Enterprises) හි 3.4 ඡේදයේ සඳහන් කරුණු අදාළ රාජ්‍ය ව්‍යාපාරයන් විසින් පිළිපැදිය යුතුය.

රාජ්‍ය ව්‍යාපාරයන්හි සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2013.01.15 දිනැති හා අංක 01/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මෙයින් අවලංගු වේ.

මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම අවශ්‍ය නම්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ( දු.අ. 011-2484617) හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( දු.අ. 011-2484627) අමතා ලබා ගත හැකිය.

එස්.ආර්. ආටිගල
භාණ්ඩාගාර ලේකම්

පිටපත්: 1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාව